000024

ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව

මැනුම් ක්ෂේත්‍ර සහායකවරුන් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2024,නොවැම්බර්

2024.11.23 කාලය: පැය දෙකයි (02) පැය 09.00 සිට 11.00 දක්වා

උපදෙස් :

විභාග අංකය:

සියලුම ප්‍රශ්න සඳහා පිලිතුරු සපයන්න. ඒ සඳහා මිනින්දෝරු දෙපාර්තමේන්තුවෙන් ලබාදෙන කඩදාසි භාවිතා කරන්න.

1.

I. මැනුම් ක්ෂේත්‍ර කන්ඩායම් ඒකකයක් සඳහා ලැගුම් දීමනාව ලබා ගැනීමට හැකියාව ඇත. එම ඒකකයේ සිටිය යුතු අවම මැනුම් ක්ෂේත්‍ර සහායකයින් ගණන කොපමණද? (ලකුණු 02)

II. නිලධාරියෙකුට ගෙවනු ලබන සංයුක්ත දීමනාවේ ප්‍රමාණය (වටිනාකම) කරුණු දෙකක් මත රඳා පවතී. එම කරුණු දෙක සඳහන් කරන්න. (ලකුණු 04)

III. රාජකාරි සඳහා බස් රථයෙන් ගමන් කල විට බස් ගාස්තු ලබා ගැනීම සඳහා ටිකට්පත් ඉදිරිපත් කිරීමට අවශ්‍ය නොවන අතර වවුචර් පතෙහි සහතිකයක් ඉල්ලුම් කරන නිලධාරියා විසින් සටහන් කළ යුතුය. එම සටහන සඳහන් කරන්න. (ලකුණු 04)

IV. "නිවාඩු දුම්රිය බලපත්‍ර යුගලයක් යනු ගමනක් යාමට හා ඒමට නිකුත් කරනු ලබන තනි බලපත්‍ර දෙකකි. ස්ථිර පත්වීම් ලබා ඇති නිලධාරියෙකුට මෙවැනි යුගල තුනක් නිවාඩු දුම්රිය බලපත්‍ර ලෙස වසරකට හිමි අතර එය යාමට හෝ ඒමට වශයෙන් වෙනම තනි බලපත්‍ර හයක් ලෙසද ලබා ගත හැකිය." ඉහත ප්‍රකාශයේ සඳහන්ව ඇති සත්‍ය සහ අසත්‍ය තොරතුරු වෙන වෙනම සඳහන් කරන්න. (ලකුණු 06)

V. ස්ථිර පත්වීමක් ලද මැනුම් ක්ෂේත්‍ර සහායකවරයකු සඳහා රාජකාරී දුම්රිය බලපත්‍රයක් ඉල්ලුම් කල හැකි අවස්ථා දෙකක්(02) සඳහන් කරන්න. (ලකුණු 04)

2. ඉංජිනේරු මැනුමක් සිදුකර පිඹුරක් සකස් කිරීමට මැනුම් ඉල්ලීමක් ලැබී ඇති බව පූර්ණමානය භාවිතා කරමින් මැනුම් කටයුතු වල නිරතවන ඔබගේ මිනින්දෝරු මහතාගෙන් ඔබට දැනගැනීමට ලැබින.

I. සාමාන්‍ය මැනුමක සහ ඉංජිනේරු මැනුමක ඇති ප්‍රධාන වෙනස් කම කුමක්ද? (ලකුණු 06)

II. සාමාන්‍ය මැනුමක් සඳහා භාවිතා කරන මැනුම් උපකරන වලට අමතරව ඉංජිනේරු මැනුම සඳහා භාවිතා කරන මැනුම් උපකරණ 02 ක් නම් කරන්න. (ලකුණු 04)

III. එම උපකරණ භාවිතා කර ලබා ගන්නා තොරතුරු මොනවාද? (ලකුණු 02)

IV. ඔබගේ මිනින්දෝරු මහතා සිදු කරන වෙනත් මැනුම් වර්ග 02 ක් ලියා දක්වන්න. (ලකුණු 04)

V. ක්ෂේත්‍රයේ මායිම් ගල් පිහිටුවීමේදී සැලකිලිමත් විය යුතු කරුණු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

3.

I. ක්ෂේත්‍රයේදී අලුතින් භූමිතික පාලන ලක්ෂයක් පිහිටුවීමේදී සැලකිලිමත් විය යුතු කරුණු පහක් සඳහන් කරන්න. (ලකුණු 10)

II. පිඹුරක පරිමාණය යන්නෙන් අදහස් කරන්නේ කුමක්දැයි කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06)

III. මැනුම් කටයුතු වලදී භාවිතා කරන කුඤ්ඤ වර්ග හතරක්(04) සඳහන් කරන්න. (ලකුණු 04)

4. .

I. "නිවාඩු යනු රජයේ සේවයේ නිරතවන නිලධාරීන්ගේ අයිතිවාසිකමකි" මෙම ප්‍රකාශය නිවැරදි ප්‍රකාශයක්ද / වැරදි ප්‍රකාශයක්ද? ඔබගේ පිලිතුර පැහැදිලි කරන්න. (ලකුණු 04)

II. "මෙරට ගතකරන නිවාඩු ඉල්ලුම් කිරීමේදී පොදු 125 "අ" ආකෘති පත්‍රය භාවිතා කල යුතුය." මෙම ප්‍රකාශය නිවැරදි ප්‍රකාශයක්ද / වැරදි ප්‍රකාශයක්ද? ඔබගේ පිලිතුර පැහැදිලි කරන්න. (ලකුණු 04)

III. "එක් එක් වර්ෂය තුල ඉතිරි කරගන්නා අනියම් නිවාඩු තම සේවා කාලය සමග ඉදිරියට රැගෙන යා හැක." පැහැදිලි කරන්න. (ලකුණු 04)

IV. ස්ථිර, තාවකාලික, අනියම් හෝ අභ්‍යාසලාභී රාජ්‍ය නිලධාරිනියන් ප්‍රසූත නිවාඩු හිමිකම ලබති. මෙම ප්‍රසූත නිවාඩු පියවර 03ක් යටතේ රාජ්‍ය නිලධාරිනියකට ලබා ගත හැක. එම පියවර 03 කෙටියෙන් සඳහන් කරන්න. (ලකුණු 06)

V. පීතෘත්ව නිවාඩු දරු උපතේ සිට කොපමණ කාලයක් තුල ලබා ගත යුතුද? (ලකුණු 02)

5. මැනුම් උපකරණ වල ආරක්ෂාව පිළිබඳව සැලකිලිමත් වීම ක්ෂේත්‍ර රාජකාරීවල නිරත සියළුම දෙනාගේ වගකීමකි. පහත අවස්ථාවන් වලදී ක්ෂේත්‍ර මැනුම් සහායක මහතකුගේ කාර්යභාරය කෙටියෙන් විස්තර කරන්න.

I. දිනයේ වැඩ අවසන මැනුම් උපකරණය එය බහාලන පෙට්ටියට තුල තැන්පත් කිරීමට පෙර සැලකිලිමත් විය යුතු කරුණු මොනවාද? (ලකුණු 04)

II. විකෝණමානය හෝ පූර්ණමානය මැනුම් ස්ථානයක සිට ඊ ළඟ මැනුම් ස්ථානයට ගෙන යෑමට පෙර ඔබ සැලකිලිමත් විය යුතු වැදගත් කරුණු සඳහන් කරන්න. (ලකුණු 06)

III. පූර්ණමානය මැනුම් ස්ථානයක සිට ඊළඟ මැනුම් ස්ථානයට ගෙන යෑමේදී අනුගමනය කරන ක්‍රමවේදය සඳහන් කරන්න. (ලකුණු 04)

IV. විකෝණමානය මැනුම් ස්ථානයක සිට ඊළඟ මැනුම් ස්ථානයට ගෙන යෑමේදී අනුගමනය කරන ක්‍රමවේදය සඳහන් කරන්න. (ලකුණු 04)

V. චෙක් රෝලක රතු පාටින් 1 ලෙස ලකුණු කර ඇත. ඉන් අදහස් වන්නේ කුමක්ද? (ලකුණු 02)